# ව්‍යාපාර සංවිධාන -

01. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැක. ඒ සඳහා යොදා ගත හැකි නිර්ණායක 4 ක් ලියන්න.

02. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා අදාල වන ක්‍රියා පටිපාටිය දක්වන්න

03. ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරිමෙන් අත්වන ප්‍රයෝජන 2 ක් ලියන්.

04. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ග්‍රාම නිලධාරී මහතාගෙන් අයදුම්පතක් ලබාගත යුතුයි.

(ආ) හවුල් ව්‍යාපාරවල නීතිමය කටයුතුවලදී හවුල්කරුවන් සිය පෞද්ගලික නම්වලින් පෙනී සිටියි.

(ඉ) දෙපාර්තමේන්තුවල අයිතිය සම්පූර්ණ වශයෙන් රජය සතු වේ.

(ඊ) සමූපකාර සමිති ව්‍යාපාර පෞද්ගලික අංශයට අයත් බැවින් රාජ්‍ය අනුග්‍රහය හිමි නොවේ.

05. අ) සමිති සංවිධානවල දක්නට ලැබෙන වාසියක් හා අවාසියක් දක්වන්න

ආ) ව්‍යාපාර සංවිධානයක් තොරා ගැනීමේ දී පදනම් වන අරමුණු දෙක කුමක්ද?

ඇ) පහත සඳහන් ව්‍යාපාර සංවිධාන සම්බන්ධයෙන් පවතින වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න.

(A) ඒක පුද්ගල ව්‍යාපාර

(B) හවුල් ව්‍යාපාර

(c) සංස්ථාපිත සමාගම්

(D) රාජ්‍ය සංස්ථා

06. ශ්‍රී ජයවර්ධනපුර සරසවියට ඇතුලත්ව ව්‍යවසායකත්ව අධ්‍යයනය පිළිබඳ උපාධි ලබා ගත් හරිතා අමරසිරි සහ අමාලි පෙරේරා යන දෙදෙනා එක්ව දේශීය, පෝෂ්‍යදායී සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය හා අලෙවි කරීමේ අවන්හලක් "හරිත හෙළ බොජුන්" නමින් ආරම්භ කරන ලදී.

(1) මෙම ව්‍යාපාරය කුමන වර්ගයේ ව්‍යාපාර සංවිධානයකට අයත්වේ ද?

(2) මෙම ව්‍යාපාරය මගින් ඉටුකරන මිනිස් අවශ්‍යතාව සඳහන් කරන්න.

(3) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධ පවතින වාසි දෙකක් ලියන්න.

(4) මෙම ව්‍යාපාර සංවිධානය සම්බන්ධව පැවතිය හැකි අවාසි දෙකක් ලියන්න.